තිරප්පනේ රජයේ පාසලක ඉගෙනුම ලබනා බාලවයස්කාර පාසල් දැරියක්, ගුරු විවේකාගාරය තුළදී හමුදා සෙබළෙකු අතින් බරපතළ ලිංගික හිංසනයකට පාත්‍ර වූ පුවතක්, අරුණ පුවත්පත (ජූනි 03, 2022) තුළ වාර්තා වී තිබිණි. ඒ, "ගුරු විවේකාගාරයේ දී කැකුළු මලක් තළා දැමූ නරුම සෙබළා අත්අඩංගුවට" යන සිරස්තලය සමඟිනි.

එසේම, පුවත් අන්තර්ගතය තුළ එම දැරිය "දූෂණය" කර ඇතැයි පොලිසිය පවසන බවද සඳහන්ව තිබිණි.

ඔබ සිතන ආකාරයට,

1) බරපතළ ලිංගික හිංසනයක් "කැකුළු මලක් තලා දැමීමක්" යැයි භාවාතිෂය ආකාරයකින් ඉදිරිපත් කිරීම ඔස්සේ, එම අපරාධය සැබෑ ලෙසින් පාඨකයාට ඉදිරිපත් වන්නේ ද?

2) එසේම, ලිංගික අපරාධයක් 'කැකුළු මලක් තලා දැමීමක්' වෙත ලඝු කිරීම ඔස්සේ, ඊට මුහුණ පෑ පාසල් සිසුවියට නැවත යථා තත්වයට පත් විය නොහැකි විනාශයක් සිදුවී ඇති බවක් ගම්‍ය නොවන්නේ ද? එය ඇය සමාජය තුළ කොන් කිරීමකට, ගර්හාවකට මුහුණ දීමට පවා හේතුවක් නොවනු ඇතිද?

3) ලිංගික අපරාධයකට මුහුණ පෑ අයෙකු අපවිත්‍ර වූ බවක් හඟවන "දූෂණය" වැනි යෙදුමකට වඩා, 'ලිංගික අපරාධය', 'ලිංගික අපයෝජනය' වැනි යෙදුමක් වඩා උචිත නොවන්නේ ද?